**පදියතලාව ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පදියතලාව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණ** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සංවර්ධනය සඳහා සහ භාණ්ඩ මිලදීගැනීම සඳහා දරන ලද රු.1,612,525 ක වටිනාකමක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පිළිගන්නා බව. මිලදී ගන්නා ලද රු.1,612,525 වත්කම් අයිතමයන් 2023 වර්ෂ අවසාන ගිණුම් සකස් කිරීමේදි ප්‍රාග්ධනිත කර ගිණුම් ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ඉදිකරන ලද මහජන වැසිකිළියේ ආබාධිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ මාර්ගය හා සුදු යකඩ වැට සෑදීම සඳහා දරන ලද රු.295,000 ක වටිනාකම සහ නළ ළිං 02 ක් ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.1,251,650 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පිළිගන්නා බව. 2023 වර්ෂ අවසාන ගිණුම් සකස් කිරීමේදි ප්‍රාග්ධනිත කර ගිණුම් ගත කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අදාළව ගෙවිය යුතු රු.1,041,877 ක ණයහිමියන් ගිණුම් ගතකර නොතිබුණි. | පිළිගන්නා බව. ඉදිරි වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් ගත කිරිමට කටයුතු කරන බව. | -එම- |

**1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා**

| | **විගණන නිරීක්ෂණ** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් 03 ක් සහ ඒවාට අදාළ උපලේඛනවල එකතුන් සමග රු.18,862,107 ක නොසැසඳීමක් විය. | පිළිගන්නා බව. පොදු ගබඩා ශේෂයේ වෙනස වර්ෂ ගණනාවක සිට පැවත එන ශේෂයකි. ඉදිරි වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීමේදී නිවැරදිව ගිණුම් ගත කිරිමට කටයුතු කරන බව. | ලේඛන නිවැරදිව යාවත්කාලීන කර නොගැලපීම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘති ගිණුමේ හා මුදල් පොතෙහි ශේෂය ශුන්‍යව තිබිය දී මුදල් මාරු ලෙජර් ගිණුමේ රු.1,852,113 ක ශේෂයක් පැවතුණු අතර මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. ඉදිරි වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීමේදී මුදල් මාරු ගිණුමේ ශේෂය ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂය හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,046,831 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,434,941 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් ගිණුම් අංක 5709296 දරන ගිණුමේ ශේෂය රු.972,035 ක් ස්ථිර තැන්පතුවක ආයෝජනය නොකිරීම හේතුවෙන් පවතින පොලී අනුපාතය මත රු.145,805 ක පමණ පාඩුවක් සභාවට සිදුකර තිබුණි. | පිළිගන්නා බව.<br>ඉදිරියේදී මේ පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ස්ථිර තැන්පතුවක ආයෝජනය කර පොලී ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| i. | වරිපනම් හා බදු | 206,000 | 228,910 | 228,910 | - | 236,000 | 131,500 | 131,500 | - |
| ii. | කුලී | 6,177,000 | 5,083,410 | 5,977,837 | 1,895,524 | 6,202,000 | 5,198,880 | 3,611,352 | 2,789,951 |
| iii. | බලපත්‍ර ගාස්තු | 276,000 | 265,175 | 265,175 | - | 401,000 | 482,021 | 482,021 | - |
| iv. | වෙනත් ආදායම් | 2,634,000 | 2,783,788 | 2,783,788 | 24,115 | 3,080,291 | 2,442,210 | 2,442,210 | 24,115 |
| | එකතුව | 9,293,000 | 8,361,283 | 9,255,710 | 1,919,639 | 9,919,291 | 8,254,611 | 6,667,083 | 2,814,066 |

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **කුලී** | | |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.1,895,524 ක් විය. | හිඟ කඩ කුලී ආදායමින් මේ වන විට රු.96,610 ක් අයකර ගෙන තිබෙන අතර අනෙකුත් හිග මුදල් අය කරගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| | **වෙනත් ආදායම්** | | |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම රු.870,650 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගත් වීථි ලාම්පු කට්ටලවලින් රු.876,150 ක් වටිනා වීථි ලාම්පු අයිතම තොගයක් සවි කිරීමකින් තොරව ගබඩාවේ මාස 11 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි. | විදුලි කාර්මික ශිල්පියා හදිසි අනතුරකට ලක් වීම හේතුවෙන් වීථි ලාම්පු සවි කිරීමේ කටයුතු සිදුකළ නොහැකි වූ අතර ප්‍රමුඛතාවය මත මේ වන විට සවි කිරීමේ වැඩ කටයුතු සිදු කරමින් පවතින බව. | අවශ්‍යතාවය මත පමණක් මිලදීගැනීම් සිදුකළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.697,419,646 ක් වූ ස්ථාවර වත්කම් වර්ගීකරණයන්ට අනුව උපලේඛන සකස් කර එක් එක් අයිතම අනුව වටිනාකම හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. ස්ථාවර වත්කම් වර්ගීකරණයට අනුව උප ලේඛන සකස් කර යාවත් කාලීන කිරීමට කටයුතු කරන බව. | උපලේඛන සකස් කර ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 36ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගන්නා බව. සුසාන භූමි වටිනාකම ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරන බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව භාරයේ පවතින වාහන 10 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර වාහන 07 ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි වාහන අදාල ආයතන වෙත ලබා දී වෙන්දේසියේ විකිණීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගන්නා බව. අදාළ ආයතන වෙත පැවරීම් කටයුතු සඳහා ඉල්ලීම් ලිපි සහ වාහන 06 ක් වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කර එම ආයතන සඳහා ලිපි යවා ඇති බව. | වාහන අයිතිය පවරා ගැනීමට හා භාවිතා කළ නොහැකි වාහන වෙන්දේසි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 09 ක් පුරප්පාඩුව පැවති අතර පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | පුරප්පාඩු පිළිබඳව දැනුම් දී ඇති අතර ඉහළින් ඒ පිළිබඳව ක්‍රියාත්මක වී නොමැති බව. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |